**කොළඹ විශ්වවිද්‍යාලීය පරිගණක අධ්‍යයන ආයතනය - 2014**

කොළඹ විශ්වවිද්‍යාලීය පරිගණක අධ්‍යයන ආයතනයේ 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 107(5) උපවගන්තිය සහ 18 වන වගන්තිය යටතේ පනවා ඇති 2002 අංක 01 දරන කොළඹ විශ්වවිද්‍යාලීය පරිගණක අධ්‍යයන ආයතන නියමාවලියේ 23 වගන්තිය සඳහා සංයෝජිතව කියවියයුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්වවිද්‍යාල පනතේ 108(1) වගන්තිය ප්‍රකාර ආයතනයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. අචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදනම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2014 දෙසැම්බර් 31 දිනට කොළඹ විශ්වවිද්‍යාලීය පරිගණක අධ්‍යයන ආයතනයේ මූල්‍ය තත්ත්වය හා එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද පිරිවැය රු.1,235,809 ක්වූ වත්කම් තවදුරටත් ආයතනය ප්‍රයෝජනයට ගනිමින් පැවතුනද එහි සඳහන් අගය පෙන්නුම් කෙරෙන පරිදි ප්‍රත්‍යාගණනය කර ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

#### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2014 දෙසැම්බර් 31 දිනට පිළියෙල කරන ලද මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය අනුව රු.50,077 ක් වූ උපචිත වියදම් ගිණුම් වලින් අත් හැරී තිබුණි.

(ආ) පශ්චාත් උපාධි පාඨමාලා සඳහා 2015/ 2016 වර්ෂය වෙනුවෙන් සමාලෝචිත වර්ෂය අවසානයට ලැබුනු මුළු පාඨමාලා ගාස්තුව රු.51,060,000 ක් වුවද මූල්‍ය ප්‍රකාශන වල ඉදිරියට ලැබු පාඨමාලා ගාස්තු ලෙස රු.51,082,500 ක් දක්වා තිබීමෙන් ජංගම වගකීම් රු.22,500 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

#### 2.2.3 නොසැසඳුණු පාලන ගිණුම්

සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය අනුව බාහිර විභාග මධ්‍යස්ථාන (EDC) විසින් පවත්වනු ලබන Bachelor of Information Technology (BIT) පාඨමාලාවේ ආදායම හා බාහිර විභාග මධ්‍යස්ථානය විසින් විගණනය වෙත ඉදිරිපත් කරන ලද තොරතුරු වල සඳහන් එම ආදායම සමඟ සැසඳීමේදී රු. 1,867,934 ක වෙනසක් නිරීක්ෂණය විය.

### 2.3 ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගණුදෙනු

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 99(1) වගන්තිය ප්‍රකාරව ආයතනය විසින් උපයනලද සියළුම ආදායම් ආයතනයේ අරමුදලේ කොටසක් වියයුතු අතර 2006 දෙසැම්බර් 22 දිනැති අංක PF/423 දරන රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛයේ විධිවිධාන වලට පටහැනිව මූල්‍ය කමිටු අනුමැතිය මත ආයතනය විසින් වෛද්‍ය රක්ෂණ අරමුදලක් ඇතිකර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.4,739,294 ක ශේෂයක් පැවතුණි.

### 2.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) කාර්යය අවසන් කර තිබුණු විදේශ ව්‍යාපෘති 05ක පැවති රු.11,559,430 ක අරමුදල් ශේෂ වසර 3 කට වැඩි කාලයක් තිස්සේ නිරවුල් කිරීමට කටයුතු නොකර ගෙවියයුතු ගිණුම් යටතේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට විවිධ හේතුන් නිසා සේවය අවසන් කර තිබූ ආයතනයේ නිලධාරීන්ගෙන් හා සේවකයින් 7 දෙනෙකුගෙන් ආයතනයට අය විය යුතු රු.234,874 ක ණය ශේෂයක් වසර 5 කට වැඩි කාලයක් අය නොවී පැවතුණු අතර මෙම මුදල් සේවක අර්ථ සාධක අරමුදලින් හෝ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) ආයතනය මගින් මෙහෙයවනු ලබන තොරතුරු ආරක්ෂාව පිළිබඳ විද්‍යාපති (Master of Science in Information Security (MSC in IS) පාඨමාලාවේ 2013 වර්ෂයට පෙර ලැබිය යුතුව තිබූ රු.30,000 ක මුදලක් 2015 අගෝස්තු 31 වනවිටත් අයකරගැනීමට කටයුතු කර නොතිබුණි.

**2.5 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| | නීති රීති හා රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම් |
|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 371 | අත්තිකාරම් ලබා දීමේදී අදාළ කාර්යය සඳහා ඇස්තමේන්තු අනුව ප්‍රමාණවත් මුදලක් ලබාදිය යුතු වුවත් අවස්ථා 18 කදී නිලධාරීන් 8 දෙනෙකු සඳහා රු.230,245 ක් වූ අත්තිකාරම් වැඩිපුර ලබාදී තිබුණු බව නිරීක්ෂණය විය. |
| (ආ) | 2002 අංක 01 දරන කොළඹ විශ්වවිද්‍යාලීය පරිගණක අධ්‍යයන ආයතන නියමාවලියේ 3 (ඇ)(ඇ) වගන්ති | ආයතනය විසින් ආරම්භ කරනු ලබන උපාධි සහ අනෙකුත් පාඨමාලා සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතිය ලබාගත යුතු වුවත් ආයතනය විසින් පවත්වාගෙන යන පාඨමාලා 06 ට අදාල අනුමැතිය ලබාගෙන නොතිබුණි. |
| (ඇ) | 2006 දෙසැම්බර් 22 දිනැති අංක PF/423 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | අරමුදල් පිහිටුවීමේදී භාණ්ඩාගාර අනුමැතිය ලබාගත යුතු වුවත් 2014 දෙසැම්බර් 31 දිනට එකතුව රු.9,960,290 ක් වූ අරමුදල් ගිණුම් හතරකට අදාල අනුමැතිය ලබාගෙන නොතිබුණි. |

**3. මූල්‍ය සමාලෝචනය**

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිඵලය රු.30,988,222ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.75,145,030 ක් වී තිබුණි. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.44,156,808 ක් අඩුවීම සඳහා සේවක පරිපාලන වියදම් රු.20,408,301 කින් සහ ගිවිසුම්ගත සේවා වියදම රු.3,885,343 කින් වැඩිවීමද වැඩසටහන් ආදායම රු.16,337,813 කින් අඩුවීමද ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 ගිවිසුම් හා බැඳුම්කර කඩ කිරීම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අධ්‍යයන හා අනධ්‍යයන කාර්යමණ්ඩලය ආයතනය සමග අත්සන් කර තිබූ ගිවිසුම් හා බැඳුම්කර කඩකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.11,011,710 ක් අය වියයුතු අතර එම වටිනාකම මූල්‍ය ප්‍රකාශන තුළින් හෙළිදරව් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ආචාර්යවරයෙකුගෙන් අයවිය යුතු වූ රු. 3,440,575 ක ගිවිසුම් බැඳුම්කර වටිනාකම් අදාල ආචාර්යවරයා පිළිබඳ තොරතුරු සොයාගැනීමට නොහැකිවීම හේතුවෙන් අයකර ගැනීම අවිනිශ්චිත වූ අතර එය අයකර ගැනීම සඳහා ප්‍රමාණවත් පරිදි කටයුතු කර නොතිබුණි.

### 4.2 අරමුදල් ඌන උපයෝජනය

ප්‍රාග්ධන ප්‍රදාන වශයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් ආයතනය වෙත ලබා දී තිබූ රු.3,103,213 ක මුදලක් වසර තුනකට වැඩි කාලයක සිට වැය නොකර ගිණුම්වල රඳවාගෙන තිබූ අතර එකී අරමුදල් ඵලදායී ලෙස යොදවා ගැනීම සඳහා ක්‍රියාකාරී සැලසුම් පිළියෙළ කර නොතිබුණි.

### 4.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ආයතනය විසින් වත්කම් අත්පත් කර ගැනීමේ අරමුණින් යුතුව පිහිටුවා තිබූ අරමුදල් දෙකක එකතුව රු.4,843,802 ක ශේෂයන් පැවති අතර සමාලෝචිත වර්ෂය තුළදී වත්කම් මිලදී ගැනීම සඳහා මෙම අරමුදල් ප්‍රයෝජනයට ගෙන නොතිබුණි.

(ආ) යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ අරමුදලේ ලැබීම් ඉක්මවා වියදම් කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු. 6,137,408 ක ඍණ ශේෂයක් නිරීක්ෂණය විය.

## 5. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර ආයතනයේ අධ්‍යක්ෂවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

(අ) වත්කම් පාලනය

(ආ) ගිවිසුම් හා බැඳුම්කර

(ඇ) මූල්‍ය පාලනය